**ජාතික ශිල්ප සභාව - 2016**

**-----------------------------**

ජාතික ශිල්ප සභාවේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1982 අංක 35 දරන ජාතික ශිල්ප සභා අනුබද්ධිත පනතේ 84(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**--------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව්කිරීම් වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම තක්සේරුකිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ජාතික ශිල්ප සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 අනුව වත්කමක් පාවිච්චි කිරීම සඳහා සූදානම් තත්ත්වයට පැමිණි පසු ක්ෂය කිරීම ආරම්භ කළ යුතු වුවත් ශිල්ප සභාව විසින් 2016 වර්ෂය තුළ මිලදී ගෙන දැනට භාවිතයේ පවතින රු.13,111,983 ක් වටිනා ස්ථාවර වත්කම් සහ 2016 වර්ෂය තුළ තක්සේරුකළ රු.28,000,000 ක් වූ වාහන 03 ක් 2016 වර්ෂය සඳහා ක්ෂය කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

රාජ්‍ය ප්‍රදානයන්ගෙන් මිලදී ගෙන තිබුණු රු.121,331,961 ක් වූ ජංගම නොවන වත්කම් වාර්ෂිකව ක්ෂය කර ඇතත්, ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම්ගත කිරීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොතිබුණි.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය බැංකු ජංගම ගිණුම් 02 කට අදාලව හඳුනා නොගත් තැන්පතු රු.468,968 ක් හා හඳුනා නොගත් හර රු.53,587 ක් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණු අතර බැංකු ජංගම ගිණුම් දෙකකට අදාලව සෘජු තැන්පත් හා නිෂ්කාශනය නොවූ තැන්පතු පිළිවෙලින් රු.52,320 ක් හා රු.2,500 ක් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන සකස්කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු පැවතීම හේතුවෙන් ඒවායේ තුල්‍යතාවය කෙරෙහි විගණනයේ දී ප්‍රශ්නකාරී විය.

   (i) ඉකුත් වර්ෂ ගණනාවක සිට මෙහෙයුම් කටයුතු සහ බැංකු සැසඳුම් සකස් කිරීම සිදු නොකරන රාජ්‍ය බැංකු ජංගම ගිණුමක 2016 දෙසැම්බර් 31 දිනට පැවති රු.13,472 ක ශේෂය මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි.

   (ii) 2016 දෙසැම්බර් 31 දිනට පොදු ලෙජරයේ ඇතුළත් වූ ලෙජර් ගිණුම් 13 කට අදාලව එකතු වටිනාකම රු.4,064,541 ක ශේෂයන් ශේෂ පිරික්සුමට ඇතුළත් කර නොතිබුණු අතර, ශේෂ පිරික්සුමේ ඇතුළත් වූ එකතු වටිනාකම රු.8,158,242 ක ගිණුම් ශේෂ ලෙජරයේ ඇතුළත් වී නොතිබුණි.

(ඈ) 2016 දෙසැම්බර් 31 දිනට ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් පාරිතෝෂික වෙන් කිරීම් රු.60,499 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය ආරම්භයේ සමුච්චිත අරමුදලට ගලපන ලද පෙර වර්ෂ වැරදි නිවැරදි කිරීම් රු.946,883 ක් සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් කටයුතුවලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී එකතු කර දක්වා තිබුණි.

(ඉ) පූර්ව වර්ෂ අතිරික්තයට හෝ ඌනතාවයට ගැළපිය යුතු නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත් 04 ක් සහ හඳුනා නොගත් ලැබීම් එකතු වටිනාකම රු.170,118 ක් හඳුනා නොගත් ලැබීම් ලෙස ආදායම් ප්‍රකාශයට ගැලපීම් කර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේදී නොපියවූ අත්තිකාරම් වෙනුවෙන් අදාල නිලධාරීන්ගේ වැටුපෙන් අය කරන ලද එකතුව වූ රු.75,950 ක මුදල් අත්තිකාරම් නිරවුල් කිරීම වෙනුවට වෙනත් ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(උ) පොල්ගොල්ල පුහුණු මධ්‍යස්ථානයේ සංවර්ධනය සඳහා 2016 වර්ෂයේදී අමාත්‍යාංශයෙන් ලැබුණු රු.713,405 මුදල හා එම මුදල වැයකර මිලදී ගන්නා ලද ප්‍රාග්ධන උපකරණ වටිනාකම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ පිළිවෙලින් පුනරාවර්ථන ලැබීම් සහ පුනරාවර්ථන ගෙවීම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට ගොඩනැගිලි ඉදිකිරීම් අවසානවී දැනට පරිහරණය කරමින් පවතින ගොඩනැගිල්ලක් සඳහා දැරූ, රු.3,699,744 ක් ප්‍රාග්ධනිත කිරීමකින් තොරව කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කර තිබීම නිසා ක්ෂය කිරීමෙන් මගහැරී තිබුණි.

### 2.2.4 පැහැදිළි නොකළ වෙනස්කම්

-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ලෙජර් ගිණුම් අනුව විවිධ අත්තිකාරම් ගිණුමේ ශේෂය රු.499,931 ක් වුවද, අත්තිකාරම් උපලේඛනය අනුව රු.588,210 ක් වූයෙන් රු.88,279 ක වෙනසක් පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව ස්ථාවර වත්කම් ගිණුම් 09 කට අදාල ශේෂයන් ස්ථාවර වත්කම් ලේඛනය සමඟ සැසඳීමේදී රු.68,608,465 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

-----------------------------------------

එකතු වටිනාකම රු.38,531,237 ක් වූ අංක 332 සිට 343 දක්වා වූ ජර්නල් සටහන්වල නිරවද්‍යතාව තහවුරු කර ගැනීම සඳහා අදාලවන උපකාරක සාක්ෂි කිසිවක් එම ජර්නල් සටහන් සමඟ හෝ වෙන්ව විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට එකතුව රු.8,204,379 ක් වූ වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂයෙන් වසර 3 ට වැඩි ණය ශේෂවල එකතුව රු.2,579,538 ක් වූ අතර, මෙම හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට එකතුව රු.4,926,862 ක් වූ වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු ශේෂයෙන් වසර 1 සිට වසර 2 දක්වා වූ ශේෂවල එකතුව රු.2,501,593 ක් හා වසර 3 ට වැඩි ශේෂවල එකතුව රු.2,425,269 ක් නිරවුල් කිරීමට පියවරගෙන නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත දැක්වෙන නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | (i) මුදල් රෙගුලාසි 115, 217, සහ 218 | සමාලෝචිත වර්ෂය තුළ ගෙවීම් වවුචර් 29 කට අදාලව එකතුව රු.763,735 ක් සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 138 (6) | ගෙවීම සනාථ කෙරෙන උපකාරක ලියවිලි නොමැතිව එකතුව රු.820,181 ක් වටිනා වවුචර් 15 ක් සඳහා ගෙවීම් සිදු කර තිබුණි. |
| | (iii) මුදල් රෙගුලාසි 138 සහ 245 (I) | සහතික කිරීමකින් තොරව, එකතුව රු.3,712,668 ක් වටිනා ගෙවීම් වවුචර් 15 කට ගෙවීම් සිදු කර තිබුණි. |
| | (iv) මුදල් රෙගුලාසි 371 (2) | තත්කාර්ය අතුරු අග්‍රිමයක් එය දෙන ලද කාර්ය නිම වූ වහාම පියවිය යුතු වුවත්, 1996 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වූ කාලය තුළ ලබාදී තිබූ එකතුව රු.316,227 ක් වූ අත්තිකාරම් පියවීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 757 | වත්කම් පිළිබඳව සමීක්ෂණයක් පවත්වා එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2017 ජූනි දක්වා වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |

## 2.5 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අත්තිකාරම් ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට පැවති රු.326,857 ක අවිනිශ්චිත ශේෂය පියවූ ආකාරය සහ ඒ සඳහා වූ අධිකාරී බලය විගණනයට තහවුරු නොකෙරුණි.

(ආ) පොල්ගොල්ල ශිල්ප ගම්මානය සංවර්ධනය සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.4,569,360 ක් ගෙවීම් කර තිබූ අතර, 2016 දෙසැම්බර් 29 දින දක්වා රු.2,764,104 ක් අමාත්‍යාංශය ප්‍රතිපූර්ණය කර තිබුණි. ඒ අනුව වෙනත් සංවර්ධන කාර්යයන්ට ලද මුදල් රු.1,805,256 ක් මෙම කාර්යය සඳහා භාවිතා කර තිබූ අතර, ඒ සඳහා විධිමත් අනුමැතියක් විගණනය වෙත ඉදිරිපත් නොකරන ලදී.

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.2,122,880 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.12,226,762 ක් වූයෙන්, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.10,103,882 ක වර්ධනයක් දක්නට ලැබුණි. රජයේ පුනරාවර්තන ප්‍රදාන රු.9,432,300 කින් ඉහළ යාම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා අඛණ්ඩව මූල්‍ය ඌනතාවයක් ඇති වී තිබුණි. කෙසේ වුවද, සේවක පාරිශ්‍රමික, රාජ්‍ය බදු හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් සැලකිල්ලට ගැනීමේදී සභාවේ දායකත්වය 2012 වර්ෂයේදී රු.49,657,039 ක් වූ අතර, එය අඛණ්ඩව වර්ධනය වී සමාලෝචිත වර්ෂයේදී රු.134,641,679 ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

1982 අංක 35 දරන ජාතික ශිල්ප සභා පනතේ 17 වන වගන්තිය පරිදි ජාතික ශිල්ප සභාව විසින්, හස්ත කර්මාන්ත භාණ්ඩ ප්‍රවර්ධනය කිරීම, සංවර්ධනය කිරීම සහ අලෙවි කිරීම සම්බන්ධයෙන් උපදෙස් දීම සහ සහය වීම, හස්ත කර්මාන්ත නිෂ්පාදන පුළුල් කිරීම සහ නිමි භාණ්ඩවල තත්ත්වය සහ ප්‍රමිති වැඩිදියුණු කිරීම, ශිල්පීන් පුහුණු කිරීමේ කාර්යය සඳහා මධ්‍යස්ථාන වැඩපොලවල් සහ වෙනත් ආයතන පිහිටුවීම, නඩත්තු කිරීම සහ මෙහෙයවීම, ශ්‍රී ලංකාවේ හා විදේශවල ප්‍රදර්ශන පැවැත්වීම, කර්මාන්තය සඳහා අවශ්‍යවන දේශීය අමුද්‍රව්‍ය සුලභ කිරීම මගින් කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදනයන් ඉහළ නැංවීම ඉටුකළ යුතු අරමුණු විය.

ඉහත සඳහන් අරමුණු ඉටුකර ගැනීම පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පසුගිය වර්ෂ පහක කාලය තුළ ආයතනය විසින් ශිල්පීන් වෙනුවෙන් පවත්වන ලද විවිධ පුහුණු වැඩසටහන් සංඛ්‍යාව හා පුහුණුව ලැබූ සංඛ්‍යාව සැසඳීමේදී 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා එම සංඛ්‍යාව ක්‍රමයෙන් ඉහළ ගොස් තිබුණද, 2015 වර්ෂයේදී එම සංඛ්‍යාව අඩුවීමක් දක්නට ලැබුණි. 2015 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේදී පුහුණු වැඩසටහන් සංඛ්‍යාව සියයට 25.6 කින් සහ පුහුණුව ලැබූ සංඛ්‍යාව සියයට 29.9 කින් ඉහළ ගොස් තිබුණි.

(ආ) පුහුණු මධ්‍යස්ථාන මඟින් පූර්ණ කාලීනව පුහුණුව ලැබූ ආධුනිකයින් සංඛ්‍යාව 2015 දී 668 ක් වූ අතර, 2016 දී එම සංඛ්‍යාව 740 ක් දක්වා 72 කින් ඉහළ ගොස් තිබුණි.

(ඇ) 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලය තුළ දේශීය හා විදේශීය අලෙවි ප්‍රවර්ධන වැඩසටහන්, තරඟ හා ප්‍රදර්ශන පැවැත්වීමේ, වර්ධනයක් තිබූ අතර, 2015 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී එම වැඩසටහන් පැවැත්වීම සියයට 26 කින් පහළ යාමක් සිදු වී තිබුණි.

(ඈ) ක්‍රියාකාරී සැලැස්මට අනුව පොල්ගොල්ල අත්යන්ත්‍ර ජේෂකර්ම ව්‍යාපෘතිය වැඩිදියුණු කිරීමේ වැඩසටහන සඳහා රු. 4,500,000 ක් වෙන් කර තිබූ අතර, රු.4,569,360 ක් ගෙවීම් කර තිබුණි. නමුත් භෞතික ප්‍රගතිය ක්‍රියාකාරී සැලැස්ම තුළ සඳහන් කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළ එක් ශිල්පියෙක් විදේශ පුහුණුව සඳහා යැවීමට ඉලක්ක කර තිබුණද, එම කාර්යය සඳහා වෙන්කර තිබූ මුදල් අලෙවි ප්‍රවර්ධන වැඩසටහන සඳහා භාවිතා කර තිබූ අතර, වර්ෂය තුළ ශිල්පීන් සඳහා විදේශීය පුහුණුවීම් ලබාදී නොතිබුණි.

(ඊ) ප්‍රදර්ශනාගාර වැඩිදියුණු කිරීම් යටතේ වර්ෂය තුළ මොළගොඩ ප්‍රදර්ශනාගාරය වැඩිදියුණු කිරීමට ඉලක්ක කර, ඒ සඳහා රු.1,000,000 ක් ඇස්තමේන්තු කර තිබුණද, වර්ෂය තුළ රු.382,000 ක් පමණක් වැය කිරීම මත එහි මූල්‍ය ප්‍රගතිය සියයට 38 ක් විය.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2009 ජනවාරි 08 දිනැති අංක අමප/08/2322/349/015 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය යටතේ දිවයින පුරා පිහිටි ශිල්පීය පුහුණු මධ්‍යස්ථාන 131 ක් සහ එහි දේපළ සභාව වෙත භාරදී තිබූ නමුත්, එම පුහුණු මධ්‍යස්ථානවලින් මධ්‍යස්ථාන 129 ක ඉඩම් හා ගොඩනැගිලි නීත්‍යානුකූලව ශිල්ප සභාව වෙත පවරාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) රාජ්‍ය සංස්ථා සහ රජයට පවරාගත් ආයතනවල විගණන ගාස්තු 1971 අංක 38 දරන මුදල් පනතේ 13(2) වගන්තිය යටතේ අදාළ අමාත්‍යවරයාගේ හා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ඇතිව විගණකාධිපති වෙත ගෙවිය යුතු වුවත්, 2016 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු.1,951,294 ක් වූ විගණන ගාස්තු ගෙවීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා අනුමත දේශීය ගමන් වියදම්, මුද්‍රණ වැය සහ අධ්‍යක්ෂ මණ්ඩල ගෙවීම් යන වැය විෂයයන් 03 හි ප්‍රතිපාදන ඉක්මවා වියදම් දැරීමෙන් පසුව අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් සංශෝධනය කරන ලද එම වියදම් වල පළමු සීමාවන් ඉක්මවීම පිළිවෙලින් සියයට 209 ක්, 374 ක් සහ 134 ක් විය.

(ඈ) ශිල්ප ගම්මාන සංවර්ධන වැඩසටහන් සඳහා සමාලෝචිත වර්ෂය තුළ එකතුව රු.2,546,040 ක් වටිනා මහන මැෂින්, පා සකපෝරු සහ මැටි අඹරන යන්ත්‍ර මිලදී ගෙන මාස 6 කට වැඩි කාලයක් ගතවී තිබුණද 2017 ජූනි මාසය දක්වා එම ද්‍රව්‍ය හා උපකරණ ශිල්පීන්ට බෙදා දීමට කටයුතු කර නොතිබුණි.

**4.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශිල්ප සභාව මඟින් පාලනයවන සීගිරිය ශිල්ප ගම්මානයේ ඇති ගොඩනැගිලි 03 ක් සහ අලෙවි කුටි 11 ක් වසර දෙකකට වැඩි කාලයක් තිස්සේ ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

(ආ) ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශය විසින් 2015 ජූනි 09 දින තාවකාලික පදනම මත ශිල්ප සභාවට ලබාදුන් වාහන 02 ක්, ලබාදුන් දින සිටම ධාවනයට නුසුදුසු තත්ත්වයේ පැවතීම මත ප්‍රධාන කාර්යාල භූමියේ නිෂ්ක්‍රීයව ගාල් කර තිබුණි.

(ඇ) රිදී ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තයේ නිරත ශිල්පීන්ට භාණ්ඩ නිෂ්පාදනයේදී භාවිතා කිරීම සඳහා ලබාදීමට 2007 – 2010 කාලය තුළ අමාත්‍යාංශ ප්‍රතිපාදන මත මිලදී ගත් එකතුව රු.13,218,660 ක වටිනාකම ඇති රිදී කිලෝ ග්‍රෑම් 97.92 ක්, වර්ෂ 07 කට වැඩි කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි. 2017 ජනවාරි 18 දිනැති අංක එන්සීසී/බීසී/2017/01/04 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව පරිදි විරල අමුද්‍රව්‍ය කළමනාකරණය යටතේ රිදී නිෂ්පාදන ආශ්‍රිත ශිල්පීන්ට මෙම රිදී තොගය බෙදාදීමට යෝජනා කර තිබුණද, 2017 මැයි 31 දක්වා ඊට අදාළව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඈ) රාජ්‍ය බැංකු ජංගම ගිණුම් 02 කට අදාල එකතුව රු.179,864 ක් වූ බැංකු ශේෂයක් ගනුදෙනු කිරීමකින් තොරව නිෂ්කාර්යව පැවතුණි.

**4.4 විධිමත්ව පවරා නොගත් ඉඩම්/දේපළ වල ව්‍යාපෘති ආරම්භ කිරීම**

අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් පොල්ගොල්ල පේෂකර්ම ව්‍යාපෘති පරිශ්‍රයේ ස්ථාපිත කර ඇති සහ ශිල්ප සභාවට නීත්‍යානුකූල හිමිකාරත්වයක් නොමැති මධ්‍යම පළාත් ව්‍යාපෘති පරිශ්‍රයේ අළුත්වැඩියා සඳහා 2016 වර්ෂය තුළදී රු.1,191,324 ක් වැය කර තිබුණි.

**4.5 කාර්ය මණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශිල්ප සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 262 ක් වුවද, සත්‍ය කාර්ය මණ්ඩලය 234 ක් වූයෙන්, ජ්‍යෙෂ්ඨ මට්ටමේ 03 ක්, ද්විතීය මට්ටමේ 01 ක්, තෘතීයික මට්ටමේ 30 ක් පුරප්පාඩුවී පැවති අතර, ප්‍රාථමික මට්ටමේ කාර්ය මණ්ඩලයේ අනුමත සංඛ්‍යාව 21 ක් වුවද, සත්‍ය කාර්ය මණ්ඩලය 27 ක් වූයෙන් එම සේවකයින් 06 ක අතිරික්තයක් පැවතුණි.

(ආ) ගිණුම් හා ප්‍රසම්පාදන නිලධාරි තනතුරෙහි සේවය කළ නිලධාරියා 2014 පෙබරවාරි මාසයේදී සේවයෙන් ඉල්ලා අස්වී තිබුණද, එම තනතුර සඳහා ස්ථිර සේවකයෙකු බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.6 ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් ක්‍රියාවලිය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 03 කදී එකතුව රු.461,999 ක් වටිනා භාණ්ඩ හා සේවා ලබාගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී පවත්වන ලද හස්ත කර්මාන්ත ප්‍රදර්ශනය සඳහා භාණ්ඩ හා සේවා මිලදී ගැනීම සඳහා අමාත්‍යාංශ ලේකම් විසින් පත්කරන ලද තාක්ෂණික ඇගයීම් කමිටුවේ සහාය ලබානොගෙන මාධ්‍ය ප්‍රචාරණ කටයුතු සඳහා පත්කල තාක්ෂණික ඇගයීම් කමිටුවක නිර්දේශ මත එකතුව රු.3,264,237 ක් වටිනා භාණ්ඩ හා සේවා මිලදී ගෙන තිබුණි.

(ඇ) 2006 ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතන චක්‍රලේඛ අංක 08 දරන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 සහ 2014 ජූලි 04 දිනැති ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය සඳහා වූ අතිරේක අංක 28 අනුව මුද්‍රා තැබූ මිල ගණන් 03 කට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීමෙන් ප්‍රසම්පාදන සැපයුම්කරු තෝරාගත යුතු වුවත්, 2016 ජාතික හස්ත කර්මාන්ත තරඟය හා ප්‍රදර්ශනයට අදාළව එකතුව රු.2,681,575 ක භාණ්ඩ හා සේවා මිලදී ගැනීම සඳහා දේදුණු පිටු වලින් මිල ගණන් කැඳවා තිබුණද මිල ගණන් තුනක් ලැබී, එම මිල ගණන් වලින් දෙකක් ප්‍රතික්ෂේප වීම මත යළි මිල ගණන් කැඳවීමක් සිදු කිරීමකින් තොරව පෞද්ගලික සමාගමක් වෙත ප්‍රසම්පාදන කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

------------------------------------------

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

------------------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පමණක් විගණනය වෙත ඉදිරිපත් කර තිබුණේ 2017 මාර්තු 31 දින දීය.

### 5.2 අයවැය ලේඛනමය පාලනය

------------------------------

සමාලෝචිත වර්ෂයේදී පුනරාවර්තන වැය විෂයයන් 6 ක ප්‍රතිපාදන හා තත්‍ය සංඛ්‍යාවල සියයට 36 සිට සියයට 194 දක්වා විචලනයන් පැවතුණි. තවද ප්‍රාග්ධන වැඩසටහන් එකක ප්‍රතිපාදන ඉක්මවා සියයට 844 ක් වියදම් කර තිබුණු අතර ප්‍රාග්ධන වැය විෂයයන් එකක ප්‍රතිපාදනය සියයට 100 ක්ම ඉතිරි වී තිබුණි. මේ අනුව අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

### 5.3 නොවිසඳී ඇති විගණන ඡේද

---------------------------------

2012 වර්ෂයේදී ශිල්ප සහා භූමියේ ශිල්ප ගම්මානයට පිවිසීම සඳහා රු.1,152,902 ක් වැය කර ඉදිකරන ලද දැව පාලම විවෘත කිරීමටත් පෙර වෙනත් සංවර්ධන කටයුත්තක් සඳහා කඩා ඉවත් කර තිබුණි. මෙම වත්කම් ගිණුම පොත් වලින් කපා හැරීමට කටයුතු කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාවේ සභාපතිනියගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර<br>---------------------------- | නිරීක්ෂණ<br>------------ |
| --- | --- |
| (අ) මූල්‍ය පාලනය | ලැබිය යුතු ශේෂ අයකර නොගැනීම, අක්‍රීය බැංකු ගිණුම් පැවතීම. සහ බැංකු සැසඳුම් සකස් කිරීමේදී නිරවුල් නොකළ ශේෂ පැවතීම. |
| (ආ) ස්ථාවර වත්කම් පාලනය | වත්කම් ලේඛන නිසි පරිදි නඩත්තු නොකිරීම සහ සමීක්ෂණ මණ්ඩල පත් කිරීම සහ සමීක්ෂණය කිරීම ප්‍රමාද වී සිදු කිරීම. |
| (ඇ) ගබඩා පාලනය | ගබඩා ද්‍රව්‍ය සහ ප්‍රදර්ශන භාණ්ඩ තොග පාලනය යාවත්කාලීනව නොකිරීම. |
| (ඈ) ණයගැති හා ණයහිමි පාලනය | හිඟ ණය ශේෂ අයකර නොගැනීම සහ ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු නොකිරීම. |